# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1988/22 - 2016 ඔක්තෝබර් මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2016.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xii)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 140 වන වගන්තිය යටතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2016 ඔක්තෝබර් මස 12 වැනි දින.
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2016 අංක 02 දරන දේශීය වෛද්‍ය විද්‍යායතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

2. 1996 පෙබරවාරි මස 09 වන දින අංක 909/13 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත 1979 දෙසැම්බර් මස 21 වන දින අංක 67/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යායතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 5 වන ජේදයේ (ඈ) අනු ජේදයේ ''උපාධි'' යන වචනය වෙනුවට ''පශ්චාත් උපාධි, උපාධි'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි 12 වන ජේදයේ 3 (උ) අනු ජේදයේ ''උපාධි'' යන වචනය වෙනුවට ''පශ්චාත් උපාධි, උපාධි'' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි 13 වන ජේදයේ ''එක් අධ්‍යාන අංශයක් බැගින්'' යන වචන වෙනුවට ''අධ්‍යාන අංශ'' යන වචන ආදේශ කිරීමෙන්.

10 - 1667/1

1A - PG 3174 — 107 (2016/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*